# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1788/ 2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 திக | දිනය<br>Date | 01/12/2024<br>පැය 1350 |

**මාධ්‍ය නිවේදනය**

### 03. මාරක රිය අනතුරක් - මානිප්පායි පොලිස් වසම.

2024.11.30 වන දින රාත්‍රී කාලයේ මානිප්පායි පොලිස් වසමේ මානිප්පායි තාවඩි මාර්ගයේ තාවඩි ප්‍රදේශයේදී මානිප්පායි දෙස සිට තාවඩි දෙසට ධාවනය යතුරු පැදියක් එම දෙසටම පා ගමනින් මාර්ගයේ ගමන් කල පදිකයකුගේ ගැටී යතුරු පැදිය පාලනය කරගත නොහැකිව ප්‍රතිවිරුද්ධ දෙසින් ධාවනය වූ කාර් රථයක ද ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ යතුරු පැදිකරු යාපනය රෝහලට ඇතුලත් කිරීමෙන් පසු මියගොස් ඇති අතර, පදිකයා සුළු තුවාල ලබා ඇත

**මරණකරු වයස අවුරුදු 64 ක් වූ කොකුවිල් ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය යාපනය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර කාර් රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇත. අනතුර සම්බන්ධයෙන් මානිප්පායි පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

### 03. මාරක රිය අනතුරක් - තලංගම පොලිස් වසම.

2024.11.30 වන දින රාත්‍රී කාලයේ තලංගම පොලිස් වසමේ කඩුවෙල කොල්ලුපිටිය ප්‍රධාන මාර්ගයේ තලංගම උතුර ප්‍රදේශයේදී කඩුවෙල දෙස සිට බත්තරමුල්ල දෙසට ධාවනය වූ යතුරු පැදියක් මාර්ගය හරහා ගමන් කල පදික කාන්තාවකගේ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ එම කාන්තාව තලංගම රෝහලට ඇතුලත් කිරීමෙන් පසු වැඩිදුර ප්‍රතිකාර සඳහා කොළඹ ජාතික රෝහලට ඇතුළත් කර ප්‍රතිකාර ලබමින් සිටියදී මියගොස් ඇත.

**මරණකාරිය වයස අවුරුදු 74 ක් වූ තලංගම උතුර ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

මෘත ශරීරය කොළඹ ජාතික රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර යතුරු පැදිකරු ද අනතුරින් තුවාල ලබා කළුබෝවිල රෝහලේ ප්‍රතිකාර ලබන අතර, අනතුර සම්බන්ධයෙන් තලංගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**